8910
සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 6 | සිංහල භාෂාව හා සාහිත්‍යය | I ,II | පැය 02යි. |

නම:........................................................ විභාග අංකය:..................................................

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I කොටස

- පහත කළු අකුරෙන් මුද්‍රිත සාම්ප්‍රදායික යෙදුම්වලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සියදෝරිස්ගේ ඉඩම මිලදී ගැනීම **ගඟට ඉනි කැපීමක්** ලෙස සුගතන් සිතී ය.
 1. නිෂ්ඵල දෙයක් කිරීම. 2. අපහසු දෙයක් කිරීම.
 3. ප්‍රයෝජනවත් දෙයක් කිරීම. 4. පහසු දෙයක් කිරීම.

02. අනුරාධ **බේගල් ඇද බාන්නෙකු** බව කාගෙත් අදහස විය.
 1. බොරු නොකියන්නෙක්. 2. විශාල ලෙස බොරු කියන්නෙක්.
 3. සත්‍ය ගරුක අයෙක්. 4. පුරසාරම් දොඩන්නෙක්.

- හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

03. මහසෙන් හා මේඝවර්ණ යන යහළුවන් දෙදෙනා යළි මිත්‍ර වීම නිසා රට .................................... විය.
 1. භේද 2. දෙකඩ 3. සුවපත් 4. එක්සේසත්

04. ලංකාවේ වැව් හා සබැඳි මනහර.................................... වේ.
 1. විචාර 2. ජනප්‍රවාද 3. විවාද 4. විමර්ශන

05. පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පදවලට ගැළපෙන විරුද්ධාර්ථ පද පිළිවෙළින් යෙදී ඇති පේළිය වන්නේ,
 <u>අභ්‍යන්තර</u> <u>ගැටලු</u> පිළිබඳ <u>විදේශීය</u> නියෝජිතයෝ සාකච්ඡා කළහ.
 1. බාහිර - ස්වදේශීය - දේශීය 2. ස්වදේශීය - ප්‍රශ්න - බාහිර
 3. පිටත - පිළිතුර - ස්වදේශීය 4. බාහිර - විසඳුම් - ස්වදේශීය

06. පහත සඳහන් වචනවල ස්වර හා ව්‍යඤ්ජන නිසි ලෙස ගළපා ඇති වරණය වන්නේ,
 1. උදැල්ල ⟶ උ + ද් + ඇ + ල් + ල් + අ 2. මාලය ⟶ ම් + ආ + ල් + අ + ය
 3. කුමරී ⟶ ක් + උ + ම් + අ + ර් + ඊ + ඉ 4. සුවඳ ⟶ ස් + ව් + අ + න් + ද් + අ

07. "සොඳුරු" යන වචනයේ සඳහන් පිල්ලම් නිවැරදි ලෙස යොදා ඇති පේළිය වන්නේ,
 1. කොම්බුව - ඇලපිල්ල - පාපිල්ල - ඇදපිල්ල 2. කොම්බුව - පාපිල්ල - ඇලපිල්ල - පාපිල්ල
 3. කොම්බුව - ඇලපිල්ල - පාපිල්ල - පාපිල්ල 4. කොම්බුව - පාපිල්ල - ඇලපිල්ල - ඇලපිල්ල

08. පහත සඳහන් වාක්‍යයේ සඤ්ඤක අක්ෂර සහිත වචන පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
 නුඹ, සන්ධි රක්ෂකයා නොහඬවා, ඔහුගේ තෝමරය එල්ලවනු නොදකැ, කඳවුරට වදනේ.......
 1. නුඹ - සන්ධි - නොහඬවා 2. සන්ධි - නොහඬවා - කඳවුරට
 3. නුඹ - නොහඬවා - කඳවුරට 4. සන්ධි - නුඹ - කඳවුරට

● හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

09. වෘක්ෂ සැමට සෙවන ලබා ..............................

1. දෙයි. 2. දෙති. 3. දුන්හ. 4. දුන්නා ය.

10. බොහෝ සිවුපා සත්තු වනයේ ..............................

1. සැරිසරති. 2. සැරිසරයි. 3. සැරිසැරුවා ය. 4. සැරිසැරුවේ ය.

11. .............................. පොත් පාඩම් කළෙහි.

1. නුඹලා 2. නුඹ 3. අපි 4. ඇය

12. උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් පමණක් යෙදී ඇති පිළිතුර වන්නේ,

1. ගසක් - නළුවෙක් - ගායකයෙකු - නිළියක 2. කාන්තාවක් - දැරියක් - ගිරවෙක් - උපාසකයෝ
3. දරුවන් - තොප - මීයන් - හෙදියන් 4. මම - ගුරුවරු - කුරුල්ලෝ - කෑමින්

13. පහත සඳහන් වාක්‍යයේ කළු පාටින් මුද්‍රිත ස්ත්‍රී ලිංග පදවලට ගැළපෙන පුරුෂ ලිංග පද පිළිවෙළට යෙදී ඇති පේළිය වන්නේ,

අධ්‍යාපන චාරිකාවේ දී සත්තු වත්තට ගිය ඔවුන් හට සෙබඩ පිළිබඳ තොරතුරු රැසක් ගුරුතුමියක විසින් විස්තර කළ බව ශිෂ්‍යාවක් සතුටින් පැවසුවා ය.

1. අශ්වයා - ගුරුතුමෙක් - ශිෂ්‍යයකු 2. මොනරා - ගුරුතුමෙකු - ශිෂ්‍යයෙක්
3. අශ්වයා - ගුරුතුමා - ශිෂ්‍යයා 4. මොනරා - ගුරුතුමා - ශිෂ්‍යයා

14. වණය, වනය යන පදවල නිවැරදි අර්ථය වන්නේ,

1. වර්ණ, වීම 2. කැලෑව, තුවාලය 3. විස්තරය, වැනුම 4. තුවාලය, කැලය

15. පහත සඳහන් වාක්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

මවක් සිය දරුවන් සමඟ නෑ ගම ගියා ය.

1. ප්‍රථම පුරුෂ අනතීත කාල වාක්‍යයකි. 2. මධ්‍යම පුරුෂ අතීත කාල වාක්‍යයකි.
3. ප්‍රථම පුරුෂ අතීත කාල වාක්‍යයකි. 4. මධ්‍යම පුරුෂ අනතීත කාල වාක්‍යයකි.

16. නිවැරදි ලෙස විරාම ලකුණු යොදා ඇති වරණය වන්නේ,

1. "කුමරුවනි, කිසි විටක බිය නොවව. නුඹ කවරෙක් ද?"
2. මහණෙනි මේ බට දඬු සිදුරු වීම මාගේ ම පුරාතන අධිෂ්ඨානයෙකැ.
3. අපට, කුකුරුමුවන් ගෙඩි ටිකක් කඩා ගන්නට ඇත්නම්.
4. එහා කැළෑවට ගියාට මොකද? මං ඇටිකෙහෙල් කන්නේ නෑ නොවැ!

17. පහත සඳහන් වැකියේ ඉරි ඇඳි පදවලට ගැළපෙන සමානාර්ථ පද පිළිවෙළින් යෙදී ඇති පේළිය වන්නේ,

සිඟිතිගේ <u>දිගු</u> <u>වරලස</u> පිළිබඳ කාගේත් අවධානය යොමු වූ අතර, ඔවුහු එයට <u>ප්‍රසාදය</u> පළ කළ හ.

1. බබළන - කොණ්ඩය - සාදය 2. දීර්ඝ - කොණ්ඩය - සතුට
3. දීර්ඝ - කොණ්ඩය - ක්‍රෝධය 4. ක්‍රෝධය - කොණ්ඩය - කෙටි

18. පහත වචන මාරු කර නිවැරදිව ගොඩනගා ඇති වාක්‍යය තෝරන්න.

දර්ශනයකි - වර්ෂාව - මේ - ඉතා ම - උල්කාපාත - අසිරිමත්

1. උල්කාපාත වර්ෂාව අසිරිමත් මෙ ඉතා දර්ශනයකි ම.
2. දර්ශනයකි උල්කාපාත වර්ෂාව මේ ඉතා ම අසිරිමත්.
3. මේ උල්කාපාත වර්ෂාව ඉතා ම අසිරිමත් දර්ශනයකි.
4. අසිරිමත් ඉතා ම මේ උල්කාපාත වර්ෂාව දර්ශනයකි.

19. පහත සඳහන් වාක්‍යයේ යෙදී ඇති විශේෂණ පද පිළිවෙළට යෙදී ඇති වරණය වන්නේ,

ලොකු නංගී මිහිරි ගීයක් ගයමින් සතුටින් නැටුවා ය.

1. ලොකු - සතුටින් - මිහිරි 2. මිහිරි - සතුටින් - ලොකු
3. මිහිරි - ගයමින් - සතුටින් 4. ලොකු - මිහිරි - සතුටින්

20. ශිෂ්.....චාරය - ලේ..... නය - වර්..... නය මෙහි සඳහන් වචනවල ඇති හිස්තැන්වලට ගැළපෙන අක්ෂර පිළිවෙළින් ඇතුළත් කර ඇති පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

1. ඨා, ක, ද 2. ටා, ක, ධ 3. ඨා, ඛ, ධ 4. ටා, ඛ, ධ

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- 01 හා 02 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ඔබ සකස් කළ කේවල පැවරුමක් ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) ඔබ විසින් ඉටු කරන ලද කේවල පැවරුමේ නම කුමක් ද? (ල. 02)

(ii) මෙම පැවරුම ඉටු කිරීමේ දී තොරතුරු සපයා ගත් ක්‍රම තුනක් ලියන්න. (ල. 03)

(iii) මෙම පැවරුම කිරීම සඳහා ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් තුනක් ලියන්න. (ල. 03)

(iv) පැවරුම නිර්මාණය කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 03)

(v) පැවරුම ඉටු කිරීමේ දී ඔබට මතු වූ ගැටලු දෙකක් ලියන්න. (ල. 02)

(vi) ඔබ ඉටු කරන ලද පැවරුම සම්බන්ධව ඔබගේ අදහස කෙටියෙන් ලියන්න. (ල. 03)

(ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150ට නො අඩු වන සේ රචනයක් ලියන්න.

(i) ජල සම්පත සුරකිමු.

(ii) ජනකවිය යි ගැමි දිවිය යි.

(iii) වැදි ජනයා හමු වූ මොහොතක්.

(iv) පෝෂ්‍යදායී ආහාර ගෙන නීරෝගී වෙමු.

(v) මා සිත් ගත් ළමා කෘතිය. (ලකුණු 14)

03. ඔබේ පාසලේ පැවැත්වුණු වාර්ෂික චිත්‍ර ප්‍රදර්ශනය පිළිබඳ තොරතුරු විස්තර කරමින් තම මාමාට ලිපියක් ලියන්න.

හෝ

ලෝක ගුරු දිනය වෙනුවෙන් තම පන්ති භාර ගුරුතුමියට යැවීමට සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න. (ලකුණු 10)

04. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත වචනවල අර්ථ ලිහිල් කරමින්, සමස්ත අර්ථය ලියන්න.

(අ) එතැන් පටන් ඒ පොකුණ වට කොට සියලු ම බට දඬු ඒකච්ඡිද්‍ර විය. ඒකරන්ධ්‍ර විය. මේ කල්පයෙහි කල්පස්ථායික ප්‍රාතිහාර්ය සතරෙක් වන්නේ ය.

(ආ) සදවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
තබවා පුන් කුඹු විසිතුරු

(ලකුණු 05 × 02 = 10)

05. පෙළ පොත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''බ්‍රෝහියර් දුටු ලංකාව'' නමැති කෘතිය කාගේ නිර්මාණයක් ද?

(ii) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ නිර්මාණයක් ලෙස පෙළ පොතේ ඇතුළත් පාඩම කුමක් ද?

(iii) ''නරි නයිදේ රැවටිච්චී'' පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?

(iv) ගුත්තිල කාව්‍ය රචනා කරන ලද්දේ කවර යුගයේ ද?

(v) ප්‍රබන්ධෝපදේශය කාගේ නිර්මාණයක් ද? (ලකුණු 02 × 05 = 10)

06. පහත සඳහන් දෙබස් කවුරුන් විසින් කා හට කියන ලද ද?

(i) දැන් ඉරේ තත්ත්වය කොහොම ද?

(ii) ඔහු කවරෙක් ද යන බව තා දනිත් ද...

(iii) ''මෙච්චර ඉක්මනට ඒ යැයි මම බලාපොරොත්තු වුණේ නැහැ''.

(iv) ''කුමක් නිසා උනු ද? පොකුණට බැස පැන් බොව''.

(v) ''හනික, හනික බලා ඉන්ට කල් නෑ. අප හැම ම බඩගින්නේ''.

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ශ්‍රී ලංකාද්වීපයට ප්‍රථම වරට බටහිර ජාතීන්ගේ ආක්‍රමණ එල්ලවීම ඇරඹුණේ 1505 දී පෘතුගීසීන්ගේ පැමිණීමත් සමගිනි. ඉන් පසු පෘතුගීසීන් පලවා හරිමින් ලන්දේසීන් ද ලන්දේසීන් පලවා හරිමින් ඉංග්‍රීසීන් ද මෙරටට පැමිණිය හ. ඉංග්‍රීසීහු 1815 මාර්තු මස 02වන දා උඩරට දී අත්සන් කළ සුප්‍රකට උඩරට ගිවිසුම මගින් මුළු ශ්‍රී ලංකාද්වීපය ම බ්‍රිතාන්‍ය කිරීටයට යටත් කර ගත්හ.

බටහිර ජාතීන් ශ්‍රී ලංකාවට පැමිණීමේ අරමුණු දෙකක් ප්‍රධාන විය. ඉන් පළමුවැන්න රටේ තිබූ වටිනා සම්පත් සූරාකමින් ඔවුන්ගේ මව් රටවල් පොහොසත් කිරීමයි. දෙවැන්න නම් ඔවුන්ගේ ආගම ශ්‍රී ලංකාව පුරා ම ව්‍යාප්ත කිරීම යි.

(i) ප්‍රථම වරට ශ්‍රී ලංකාව ආක්‍රමණයට ලක් වූයේ කුමන වසරේ දී ද?

(ii) ශ්‍රී ලංකාව ආක්‍රමණය කළෝ කවරහු ද?

(iii) 1815 දී අත්සන් කරනු ලැබූ සුප්‍රකට ගිවිසුම කුමක් ද?

(iv) බටහිර ජාතීන් ශ්‍රී ලංකාවට පැමිණීමේ අරමුණු දෙක කුමක් ද?

(v) පහත සඳහන් පදවල අර්ථය ලියන්න.

කිරීටය = ........................................

ආක්‍රමණය = ........................................ (ලකුණු 02 × 05 = 10)